මගේ අංකය: NP/19/06/P1/Circular/2017/04

2017.09.28

චක්‍රලේඛ අංකය: 2017/04

දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන්,
සියළුම ග්‍රාම සංවර්ධන නිලධාරීන් / සංවර්ධන නිලධාරීන්,
ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

ග්‍රාම සංවර්ධන සමිති සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිති නියාමනය කරනු ලැබ, ආයතනගත කිරීම.

1. ග්‍රාම සංවර්ධන සමිති සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිති ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධනයට අඩිතාලමක්ව පිහිටීමත් සමග සම්පූර්ණ දේශීය නිෂ්පාදනවලට දායකත්වය දරණ ව්‍යුහගත ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වන බව සහතික කරලිය යුතුය.

2. විනිවිදභාවය, යහපාලනය සහ ගණන්දීමේ සුදුසුකම යනාදිය ස්ථිරාත්මකව පිහිටුවීමට හැකිවන ආකාරයෙන් ග්‍රාම සංවර්ධන සමිති සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිති නියාමනය කරනු ලැබ, ඒවා ආයතනගත කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

3. මෙය ක්‍රියාත්මක කරලීම පිණිස සමිති මත පහත සඳහන් ක්‍රියාදාම සිදු කරලීම මෙම චක්‍රලේඛය මගින් බලාත්මක කරනු ලැබේ.

   (i) **සියළුම ග්‍රාම සංවර්ධන සමිති සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිති උතුරු පළාතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරනු ලැබ, ක්‍රියාත්මක විය යුතුය.** අවිච්ඡින්නව පරිපාලන කාරක සභා රැස්වීම් හෝ මහා සභා රැස්වීම් හෝ නොපවත්වමින්, අඛණ්ඩව වසරකට වඩා කිසිදු ක්‍රියාකාරීත්වයකින් තොරව දකින්නට ලැබෙන සමිතිවල ලියාපදිංචිය තාවකාලිකව මසකට අත්හිටුවනු ලැබේ. එකී මසක කාලය තුළ සාධාරණ හේතූන් සමග නැවත අයදුම් කරනු ලබන විට, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාගේ තීරණයට අනුව ලියාපදිංචිය අවලංගු කිරීම හෝ නොකිරීම හෝ තීරණය කරනු ලැබේ.

   (ii) වසර දෙකකට වරක් පරිපාලනය ප්‍රතිසංවිධානයකින් මිස, නොපිහිටවිය යුතුය. අදාළ කාලය තුළ පරිපාලනයේ වෙනස්වීම සඳහා මහා සභා රැස්වීමට ගණපූරණය නොමැති බව අවධාරණය වන විට, දවස් හත(7)ක කාල අවකාශය සමග නැවත මහා සභා රැස්වීම කැඳවීම කළ යුතුය. අවස්ථා දෙකකදීම ගණපූරණය නොමැති බව පෙනී ගියහොත්, එම සමිතියේ ක්‍රියාකාරීත්වය තාවකාලිකව මසකට අත්හිටුවිය යුතුය. මෙම කාල වකවානුව තුළ පරිපාලනය ප්‍රතිසංවිධානය කිරීමට අදාළවන පියවර ගනු නොලැබුවහොත්, එම සමිතිය ස්ථිරවම අත්හිටුවනු ලැබේ.

   (iii) සෑම ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා ග්‍රාම සංවර්ධන සමිති තම පරිපාලනමය තේරීමට පෙරාතුව, තම සාමාජිකයන් තහවුරු කරලීම සඳහා දායක මුදල ගෙවීම් කළ සාමාජික ලැයිස්තුව නිකුත් කරනු ලැබ, එකී තැනැත්තන් කෙරෙහි පමණක් පරිපාලනමය තේරීම සඳහාවන අවම ගණපූරණය ගණනය කිරීමට අවධානය යොමු කළ යුතුය.

(iv) සියළුම සමිති සාමාජිකයන් තම දායක මුදල, නිසි කාලය ඇතුළත ගෙවිය යුතුය. පැහැර හරිනු ලබන අවස්ථාවේ දී සාමාජිකත්වය අහිමි වන අතර පරිපාලනමය තේරීමට ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ද අහිමි වන්නේය.

(v) සමිති සඳහා නව පරිපාලන කාරක සභාවට සාමාජිකයන් තේරීම් සිදු කරනු ලබන අවස්ථාවේ දී, පෙර පරිපාලන සමයේ භාවිතයේ තිබූ සියළුම **නිශ්චල හා චංචල වත්කම්, ලේඛන, ලිපි ශීර්ෂ සහ රබර් මුද්‍රා** යනාදිය වනාම ලබාගෙන, නව පරිපාලන කාරක සභාව වෙත නිල වශයෙන් භාරදිය යුතුය.

(vi) සමිතිවල ලිපි ශීර්ප විධිමත් පරිද්දෙන් මුද්‍රණය කරනු ලැබ, භාවිතා කළ යුතුය. ජායාස්ථික හෝ පරිගණක හෝ පිටපත් භාවිතා කිරීම සහමුලින්ම තහනම් කරනු ලැබීමත් සමග ලිපි ශීර්පයේ සභාපතිවරයාගේ, ලේකම්වරයාගේ, භාණ්ඩාගාරිකවරයාගේ සහ පරිපාලන සාමාජිකයන්ගේ නම් මුද්‍රණය නොකළ, ලිඛිතව ලිවීමට හැකිවන අයුරින් ඉඩ පරතරයක් තිබෙන ලිපි ශීර්ප භාවිතා කළ යුතුය.

(vii) සමිතියේ සභාපතිවරයා, ලේකම්වරයා හා භාණ්ඩාගාරිකවරයා යන අය එක්ව සමිතිය සඳහාවන නිල මුද්‍රාව සකස් කර භාවිතා කළ යුතුය. වෙන් වෙන් වූ නිල මුද්‍රා භාවිතා කිරීම නොකළ යුතුය.

(viii) සෑම සමිතියකම ව්‍යවස්ථාවේ දැක්වෙන ගොනුවලට වැඩිමනත්ව ග්‍රාම සංවර්ධන නිලධාරියා විසින් අධීක්ෂණය කිරීමට හැකිවන අයුරින් පහත සඳහන් ගොනු ද අනිවාර්‍යයෙන්ම පවත්වාගෙන යාම කළ යුතුය.

1. ගිවිසුම් ගොනු.
2. චක්‍රීය ක්‍රමයට අදාළවන ණය ගොනු.
3. සාමාජික ගොනු.
4. විගණන වාර්තා ගොනු.
5. සමිතියේ ලියාපදිංචි ගොනු.
6. සමිතියේ පසුගිය කාලවල ඉතිහාස ගොනු.
7. සිදුවීම් ගොනු.
8. සමිතියේ ව්‍යවස්ථා, උපරිති සහ ආයතන චක්‍රලේඛ යනාදියට අදාළවන ගොනු.

(ix) මෙම චක්‍රලේඛයෙහි ක්‍රියාදාම පිළි නොපදින සමිති දකින්නට ලැබෙන අවස්ථාවේ දී, එම සමිති ආයතනගත කිරීමට නොහැකියි යන්න, අවධාරණය කර, ඒවායේ ලියාපදිංචිය අවලංගු කිරීම සම්බන්ධයෙන් තීරණය ගැනීමේ බලය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාට ඇත්තේය.

(x) ලියාපදිංචිය අහෝසි කළ සමිති පිළිබඳ විස්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පළ කරනු ලැබේ. මෙම සමිති කිසිම ආකාරයකින් පරිපාලන ක්‍රියාකාරකම්හි නියැලීමට නොහැකිය. ඒ සමග මෙම සමිතිවලට අදාළවන සියළුම වත්කම් නැවත භාරගෙන, අවශ්‍ය කරන ක්‍රියාන්විත සමිතිවලට බෙදාදීම් කරනු ලැබ, ඒවා ආයතනගත කිරීමට මාර්ග පහදා දෙනු ලැබේ.

ඉහත සඳහන් කරුණු සමිතිවලට දන්වමින් හා දැනුවත් කරමින්, ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටිමි.

“දෙමළ බසින් - සිංහල බසට භාෂා පරිවර්තනය”

ජේ.ජේ.ෆෙලිසියන්,
අධ්‍යක්ෂ,
ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

පිටපත්:-

1. ප්‍රධාන ලේකම්, උතුරු පළාත. - **කාරුණික දැන ගැනීම පිණිස.**
2. ලේකම්, ප්‍රධාන අමාත්‍ය අමාත්‍යාංශය, උතුරු පළාත. - **කාරුණික දැන ගැනීම පිණිස.**
3. දිස්ත්‍රික් ලේකම්, …….. - **කාරුණික දැන ගැනීම පිණිස.**
4. සහකාර විගණකාධිපති, උතුරු ප්‍රාදේශීකය - **කාරුණික දැන ගැනීම පිණිස.**
5. ප්‍රධාන අභ්‍යන්තර විගණාකාධි, උතුරු පළාත. - **කාරුණික දැන ගැනීම පිණිස.**
6. ප්‍රාදේශීය ලේකම්, …….. - **කාරුණික දැන ගැනීම පිණිස හා මෙහෙයවීම පිණිස.**
7. ප්‍රාදේශීය සමිති හා සංගම්, දිස්ත්‍රික් කාන්තා ග්‍රාම සංවර්ධන සමිති - **දැන ගැනීම පිණිස හා ක්‍රියාත්මක කරලීම පිණිස.**